# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2373/58 - 2024 මාර්තු මස 02 වැනි සෙනසුරාදා - 2024.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: KDS/UDB/4/1/1/147(උදු/2/5/2/71).
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 4-3/2/2012/FR/107.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ / පරවශතාවේ විස්තර*: නකල්ස් සංරක්ෂණ කලාපය සඳහා

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 893, මීමුරේ ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටි වැල්ගාල නම් වූ සර්වේ ජනරාල්ගේ කැඩස්තර සිතියම් අංක 321379 කලාප අංකය 04 පත්‍ර අංකය 1 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක 1, 3 වන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 20.2347 ක් වූ ඉඩම.

හිමිකම් කියන අය: මාතර හක්මන මැදවලව්වේ චන්ද්‍රා ලලිත් වීරසිංහ මයා සහ ලෝකේෂ්වර උත්තම චන්ද්‍රසේකර ශලනි වීරසිංහ මිය, අංක 7, නාමල් මාවත, පඩිවත්ත, කුණ්ඩසාලේ.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024.05.20 වැනි දින පූ. භා. 10.00 ට උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2024.05.13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම්/ පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ජයමිණි බෝගහවත්ත,
ප්‍රාදේශීය ලේකම්,

2024 පෙබරවාරි මස 28 වැනි දින,
උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03-0025


1A - G 041524 – 29 (2024/03)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: KDS/UDP/4/1/02/03.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 4-3/8/2020/CEB/08.

මොරගොල්ල විලේජ් නව ගම්මානය සඳහා පිවිසුම් මාර්ගය ඉදි කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම

ඉහත ශීර්ෂය යටතේ අංක 2310/08 හා 2022.12.12 දිනැතිව මා විසින් පළකරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* වන්දි පරීක්ෂණ දිනය සහ වේලාව පමණක් 2024.04.03 දින පෙ.ව. 10.00 ලෙස සංශෝධනය කරන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

ආත්මා දිලුක්ෂි ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,

2024 පෙබරවාරි මස 28 වැනි දින,
උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03- 0026